# සති පාසල
# මාවනැල්ල කලාපය
# දෙවන වාරය - පළමු සතිය

## සිංහල භාෂාව - 6 ශ්‍රේණිය

- පෙළ පොතේ 59 වන පිටුව කීප වතාවක් කියවා මහාප්‍රාණ හා අල්පප්‍රාණ පිළිබඳ දැනුම ලබා ගන්න.
- පහත දැක්වෙන පද යුගල වෙන්වෙන්ව යොදා වාක්‍ය 10 බැගින් ලියන්න. (කළ-කල , නුවණ-නුවන, පැළ - පැල, වණය- වනය, උරණ - උරණ)

## භූගෝල විද්‍යාව - 6 ශ්‍රේණිය

- ඔබේ පෙළ පොතේ 22, 23, 24 පිටු හොඳින් කියවන්න.
- 24 පිටුවේ ඇති 2 – 1 ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- ඔබේ නිවසේ වටපිටාවේ ඇති ලක්ෂණ අනුව සැලසෙන වාසි 03 ක් හා අවාසි 03 ක් ලියන්න.

## පුරවැසි අධ්‍යයනය- 6 ශ්‍රේණිය

- ශ්‍රී ලංකාවේ පරිපාලන ඒකක නම් කරන්න. (පෙළ පොත උදව් කරගන්න)
- ශ්‍රී ලංකාවේ පරිපාලන ඒකක අතරින් කුඩාම පරිපාලන ඒකකය ලියා දක්වන්න.
- එම ඒකක භාර නිලධාරියා හඳුන්වන නම කුමක් ද ?
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය භාර ප්‍රධානියා හඳුන්වන නම කුමන්ද?
- ග්‍රාම නිලධාරී කොට්ඨාස සමූහයක් එක් වී ගොඩනැගෙන පරිපාලන ඒකකය හඳුන්වන නම කුමක්ද ?

## ගණිතය - (පාඩම භාග) - 6 ශ්‍රේණිය

ඔබේ පෙළ පොතේ ඉහත පාඩමට අදාල නිදසුන් අධ්‍යයනය කරමින් 9.1 අභ්‍යාසය හා 9.2 අභ්‍යාස කරන්න

# සති පාසල

# මාවනැල්ල කලාපය

# දෙවන වාරය - පළමු සතිය

## බුද්ධ ධර්මය - 6 ශ්‍රේණිය

- දිවිමග සරුකරන සීලය පාඩම කියවන්න.
- බුදුදහමේ සදහන් සසර දුකින් මිදෙන මග කුමක් ද ?
- ත්‍රිශික්ෂාව හදුන්වන්න.

## ක්‍රිස්තු ධර්මය - 6 ශ්‍රේණිය

- පාස්කුව යනු කුමක් ද?
- දෙවියන් වහන්සේට විරුද්ධව ඔබ අතින් සිදුවිය හැකි පාප තුනක් ලියන්න.
- ඔබගේ පාපයන්ට හමාව ඉල්ලා පේළි 05 ක පමණ කුඩා යාඥාවක් ලියන්න.

## සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය - 6 ශ්‍රේණිය

- සංවිධානාත්මක ක්‍රීඩාවල දැකිය හැකි ලක්ෂණ හතරක් ලියන්න.
- ඔබ දන්නා සංවිධානාත්මක ක්‍රීඩා 05 ක් ලියන්න.

# සති පාසල
# මාවනැල්ල කලාපය
# දෙවන වාරය - දෙවන සතිය

## <u>ප්‍රායෝගික තාක්ෂණ කුසලතා - 6 ශ්‍රේණිය</u>

“නෙත පිනවන පිවිතුරු ශාඛ" පාඩම කියවා පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

- විසිතුරු ශාඛ වගා කිරීමේ දී ලබාදිය යුතු පරිසර සාධක 03 ක් ලියන්න.
- විසිතුරු ශාඛ යොදා ගනිමින් ඔබේ ගෙවත්තේ කොටසක් අලංකරණය කළ හැකි ආකාරය චිත්‍රයට නගන්න.

පැවරුම - දෙමාපියන්ගේ සහාය ඇතිව විවිධ ව්‍යුහ විලාස සහිතව විසිතුරු ශාඛ යොදා ගනිමින් ගෙවත්ත අලංකරණය කරන්න.

## <u>චිත්‍ර - 6 ශ්‍රේණිය</u>

තෛපොංගල් උත්සවය පිළිබඳ තොරතුරු සහ රූප රැස් කරන්න. (පුවත්පත්, සඟරා, අන්තර් ජාලය භාවිතා කරන්න.

## <u>සිංහල භාෂාව - 6 ශ්‍රේණිය</u>

පෙළ පොතෙහි 09 වන පාඩම හොඳින් කියවන්න.

- ඒක වචන ක්‍රියාපද 10 ක් හා බහු වචන ක්‍රියාපද 10 ක් ලියන්න.
- පහත සඳහන් ක්‍රියාපද උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ ලෙස වගුගත කරන්න.
  (බලමු, කියවමි, ගයහි, බලහු, බලති, ගියෙහි, උයයි, කරමු, ගයමි, නලවති)
- පෙළ පොතෙහි 68 වන පිටුවේ අංක 2 හා 3 අභ්‍යාස වල යෙදෙන්න.

## <u>ගණිතය - 6 ශ්‍රේණිය</u>

### <u>භාග පාඩම</u>

- පෙළ පොතේ නිදසුන් අධ්‍යයනය කරමින් ඉහත පාඩමේ 9.3 අභ්‍යාසයේ 1.2 ගැටළු හා 3. 4 ගැටළු විසඳන්න.

සති පාසල

මාවනැල්ල කලාපය

දෙවන වාරය - දෙවන සතිය

## බුද්ධ ධර්මය - 6 ශ්‍රේණිය

## පාඩම - පන්සිල් සුරකිමු.

- ගිහි බෞද්ධයාගේ නිත්‍ය සීලය කුමක් ද?
- පානාති පාතා............ යන සිල් පදයේ තේරුම ලියන්න.
- ත්‍රි කෝටික පාරිශුද්ධි සීලය නම් කරන්න.
- "ලැබෙන්නෙකින් සතුටුව දිවි ගෙවන්නෙමි" යන කවි පදය අයත් වන සිල් පදය ලියන්න.

## රෝමානු කතෝලික - 6 ශ්‍රේණිය

## පාඩම - ආරම්භක දේව ප්‍රසාද නිධාන

- ප්‍රසාද ස්නාපනයේ දී භාවිතා වන සංකේත මොනවා ද?
- ශුද්ධාත්මයාණන් වහන්සේ අප වෙතට වැඩම කරන්නේ කුමන දේව ප්‍රසාද නිධානය මාර්ගයෙන් ද?
- ජේසුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනය සිදු කලේ කවදා ද?
- ආරම්භක දේව ප්‍රසාද නිධාන ලියා දක්වන්න.
- ජේසුස් වහන්සේ බෞතිස්ම ස්නාපනය ලැබුවේ කොහේදී ද?

## සංගීතය - 6 ශ්‍රේණිය

## පාඩම - නූර්ති ගී ගායනා කරමු.

- නූර්ති රංග සම්ප්‍රදායේ නූර්ති ගී පිළිබඳ තොරතුරු රැස් කරන්න. ( පොත්පත් සඟරා, අන්තර් ජාලය භාවිතා කරන්න.)

## විද්‍යාව - 6 ශ්‍රේණිය

## පාඩම - ආලෝකය හා පෙනීම

- ක්‍රියාකාරකම 5.1 ,5.2, 5.3, 5.4 හා පැවරුම 5.1 කරන්න.
- ආලෝකය නිකුත් කරන ප්‍රභව පහක් නම් කරන්න.
- පහත දැක්වෙන ද්‍රව්‍ය පාර දෘශ්‍ය ,පාර භාෂක, පාරාන්ධ ලෙස වර්ග කරන්න. (වීදුරු, ලෝහ තහඩු, ලී, අවර්ණ පොලිතීන්, තෙල් කඩදාසි, බොර ජලය, පාට ටිෂූ කඩදාසි, තාර, ජලය, පැණි බීම, භූමි තෙල්, පැණි, දැවුණු එල්පිල් ඔයිල්)

සති පාසල

මාවනැල්ල කලාපය

දෙවන වාරය - දෙවන සතිය

<u>**නර්තනය - 6 ශ්‍රේණිය**</u>

<u>**පාඩම - සාම්ප්‍රදායික නර්තනයට හුරු වෙමු.**</u>

- නමස්කාර පදය හා එහි තේරුම කඩ පාඩම් කර ගන්න.

  නමස්කාර පදය - තෙයියත්, තෙයියත්, තෙයියත් තාම්
  තෙයියත්, තෙයියත්, තෙයියත් තාම්
  තෙයියත්, තෙයියත්, තෙයියත් තාම්
  තෙයියත්, තෙයියත්, තෙයියත් තාම්

  එහි තේරුම - පළමුව පොළොව මහී කාන්තාවගෙන් අවසර
  මගේ හෘද සාක්ෂියට අනුව මම බුදුන් වදිමි.
  දෙවනුව දෙවියන් ද වදිමි.
  තෙවනුව ගුරුවර දෙවාපියන්ට වදිමි.
  සිව්වනුව සබේ සැමට වදිමි.